**ශීර්ෂය 217- පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

ශීර්ෂය 217 - පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරින්ගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

-------

**2.1 විසර්ජන ගිණුම**

---

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

දෙපාර්තමේන්තු සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 323.20 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 307.03 ක් උපයෝජනය කර තිබුණි. **ඒ අනුව** දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන16.17 ක් හෙවත් සියයට 5 ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 290.08 | 278.21 | 11.87 | 4.10 |
| මූලධන | 33.12 | 28.82 | 4.30 | 12.95 |
| **එකතුව** | **323.20** | **307.03** | **16.17** | **5.00** |

**2.2 අත්තිකාරම් ගිණුම**

**2.1.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාළ වැය විෂයය අංක 21701 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 12.50 | 11.87 | 7.20 | 9.36 | 52.50 | 41.36 |

**2.3 විගණන නිරීක්ෂණය**

පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

දෙපාර්තමේන්තු විසින් පහත දැක්වෙන ලේඛනයක් පවත්වා නොතිබුණු අතර තවත් ලේඛන දෙකක් විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|---|
| (i) | හානි පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 110 | පවත්වා නොතිබුණි |
| (ii) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය. | යාවත්කාලීන කර නොතිබුණි |
| (iii) | පරිගණක මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඑ.අයි/2002/2 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | යාවත්කාලීන කර නොතිබුණි |

## 3.2 විගණනයට සාක්ෂි නොවීම

පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුවෙන් පළාත් පරිවාස දෙපාර්තමේන්තුවලට ලබාදුන් ප්‍රතිපාදනවලින් සිදුකළ ඉදිකිරීම්, භාණ්ඩ හා උපකරණ මිලදී ගැනීම් හා වැඩසටහන් පැවැත්වීමට අදාළ බිල්පත්, ඉන්වෙන්ට්‍රිගත කිරීම්, බෙදාදීම් ආදි වූ අවශ්‍ය සාක්ෂි නොතිබීම නිසා රු.20,653,900 කට අදාළ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය.

## 3.3 විගණන විමසුම්වලට පිළිතුරුදීම

දෙපාර්තමේන්තුව වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 03 කට 2016 ජුනි 30 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. එම විමසුම්වලට අදාල ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු.11,459,315 ක් විය.

## 3.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

### 3.4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් පිළියෙළ කර තිබු ක්‍රියාකාරී සැලැස්මේ භෞතික සැලැස්ම දක්වා නොතිබු අතර මූල්‍ය හා භෞතික ප්‍රගතිය සැසැඳිය හැකි ආකාරයට ප්‍රගති වාර්තාද ඉදිරිපත් කර නොතිබුණි.

### 3.4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 4 ඡේදය ප්‍රකාරව සවිස්තරාත්මක ප්‍රසම්පාදන කාල සටහන යාවත්කාලීන කර නොතිබුණි.

### 3.4.4 අභ්‍යන්තර විගණනය

දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි. කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය විසින් දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණනය සිදුකළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේදී අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

## 3.5 අනුකූල නොවීම

**බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම**

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති එකතු කළ අගය මත බදු ගෙවනු ලබන ආයතනවලට පමණක් සැපයීම් හා සේවා සඳහා ගෙවීම් කිරීමේදී එකතු කළ අගය මත බදු එකතු කර ගෙවීම් කළ යුතුව තිබුණි. නමුත් එකතු කළ අගය මත බදු ගෙවීම සඳහා ලියාපදිංචි අංක නොදන්න ආයතන 2 ක් වෙත එකතුව රු.126,848 ක එකතු කළ අගය මත බදු වශයෙන් ගෙවා තිබුණි.

**3.6 කාර්යසාධනය**

2015 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව, ක්‍රියාකාරි සැලැස්ම හා දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ) ප්‍රධාන අරමුණුවලට අදාළ කාර්යවලින් බැහැරව ක්‍රියා කිරීම**

ශ්‍රී ලංකා සමාජ පසුබිම තුළ අනාථ, අත්හල හා අසරණ ළමුන්ගේද නීතිමය ගැටළුවලට බඳුන් වූ වෙනත් ළමුන්ගේද අයිතිවාසිකම්, පූර්ණ සංවර්ධනය හා ආරක්ෂාව සුරකෙන ලෙස ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව ප්‍රතිපත්ති සම්පාදනය, ක්‍රියාත්මක කිරීම, පසුවිපරම් කිරීම, ඇගයීම යන කටයුතු සම්බන්ධ කර ජාතික යාන්ත්‍රණය ලෙස කටයුතු කිරීම දෙපාර්තමේන්තුවේ මෙහෙවර වුවද, 1956 වර්ෂයේ ආරම්භ වූ දෙපාර්තමේන්තුව සමාලෝචිත වර්ෂය අවසන් වන විට වර්ෂ 60 ක් පමණ වී තිබුණද, ළමුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා වන පරිදි විශ්ව ප්‍රඥාප්තියට අනුකූලව ජාතික ප්‍රතිපත්ති සකස් කිරීම හා නීති සම්පාදනය කිරීම 2016 වර්ෂය වන විටත් සිදුකර නොතිබුණි.

**(ආ) ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව, ළමා නිවාස 400 ක් අධීක්ෂණය කිරීම සඳහා සලසා තිබුණු රු. මිලියන 2.00 කින් රු.මිලියන 1.76 ක් ළමා නිවාස 215 ක් අධීක්ෂණය කිරීම සඳහා පළාත් පරිවාස කොමසාරිස්වරුන් වෙත යවා තිබුණි. ඉන් රු.මිලියන 1.09 ක් යැවූ කාර්යාල 6 කින් අධීක්ෂණ වාර්තා ලබාගෙන ඉදිරි පියවර ගැනීමට කටයුතු කර නොතිබුණි. විවිධ කාර්යයන් සිදු කිරීම සඳහා පළාත් පරිවාස දෙපාර්තමේන්තු වෙත යැවූ මුදල්වලින් අදාළ කාර්යයන් සිදු නොකිරීම නිසා ඉතිරි වූ රු.මිලියන 1.03 ක්ද, දෙපාර්තමේන්තුව වෙත නැවත එවා නොතිබුණි.

(ii) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ළමා හිමිකම් ප්‍රවර්ධන/සහකාර නිලධාරීන් 389 දෙනෙකු දෙපාර්තමේන්තුවේ සේවය කරනු ලැබේ. ඔවුන් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී වැටුප්, දීමනා, පුහුණු පාඨමාලා හා අනිකුත් ප්‍රතිලාභ වෙනුවෙන් රු. මිලියන 200.42 ක් වැයකර තිබුණි. ඔවුන් විසින් සිදුකරනු ලබන කාර්යයන් සම්බන්ධයෙන් දිස්ත්‍රික් නිලධාරීන් විසින් මාසික ප්‍රගති වාර්තා නියමිත පරිදි එවා නොතිබුණි. එවා තිබූ වාර්තාවලින් ද ළමුන් පිළිබඳ ප්‍රමාණවත් දත්ත සපයා නොමැති බවත් පසු විපරම් කටයුතු හා අධීක්ෂණය, නිසි පරිදි සිදු නොවන බවත් නිරීක්ෂණය විය.

(iii) සමාලෝචිත වර්ෂයේදී ළමා/දෙමාපිය/වෙනත් වශයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් 4,380 ක් සිදුකර තිබුණද, ළමා අපයෝජන සම්බන්ධයෙන් පැමිණිලි 11,084 ක් වාර්තා වී තිබුණි. එය ඉකුත් වර්ෂයට වඩා පැමිණිලි 5,735 කින් වැඩි වී තිබුණි. මේ අනුව වැඩසටහන්වලින් අපේක්ෂිත අරමුණු ඉටු කර නොතිබුණු අතර, අපයෝජන වැඩිවීමට හේතු පරීක්ෂා කර එය අවම කිරීමට ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ දෙපාර්තමේන්තුව සලකා බැලීමක් සිදුකර නොතිබුණි.

(iv) සමාලෝචිත වර්ෂයේදී අවදානම් තත්ත්වයේ පසුවන ළමුන් 3,049 ක් හඳුනාගෙන තිබූ අතර, ළමුන් 2,788 ක් සඳහා පමණක් ආරක්ෂක සැලැසුම් සකස් කිරීම හෝ ආරක්ෂාව සහතික කර තිබුණි. ඉතිරි ළමුන් සඳහා ආරක්ෂණ සැලැසුම් සකස් කිරීම හෝ ආරක්ෂාව සහතික කර නොතිබුණි.

(v) සමාලෝචිත වර්ෂයේදී වාර්තා වූ ළමා අපයෝජන 11,084 කින් ළමුන් 5,068 ක් සඳහා පමණක් පූර්ණ කාලීන විසඳුම් ලබාදී තිබුණි. පැමිණිලි 2097 ක් වෙනත් ආයතන වෙත යොමුකර තිබූ අතර පැමිණිලි 3,919 ක් සඳහා කෙටිකාලීන විසඳුම් ලබාදී තිබුණි. පැමිණිලි 94 ක් සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**3.5 අවිධිමත් ගනුදෙනු**

**-------------------**

**රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියාපටිපාටියෙන් බැහැරවීම**

**-------------------------------------------------------------------**

ශ්‍රී ලංකා පදනම් ආයතනයේ පැවැත්වූ මාස 06 ක පරිවාස හා ළමා රැකවරණ ඩිප්ලෝමා පාඨමාලාවක් හැදෑරීමට ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන් හා සහකාර නිලධාරීන් 60 දෙනෙකුට අවස්ථාව ලබාදී තිබුණි. පාඨමාලාව අවසන් වීමට පෙර 2016 ජනවාරි 11 දින පාඨමාලා ගාස්තු ලෙස රු.1,890,000 ක් ගෙවා තිබුණි. නිලධාරීන් 17 දෙනෙකු විසින් පාඨමාලා අවශ්‍යතාවන් වන අවසන් විභාග පරීක්ෂණය හෝ ඉදිරිපත් කිරීමේ පරීක්ෂණය හෝ සීමාවාසික පුහුණු සම්පූර්ණ කර නොතිබුණු අතර දෙපාර්තමේන්තුව විසින්ඒ සම්බන්ධයෙන් කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

**3.6 කළමනාකරණ දුර්වලතා**

**----------------------------**

දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේ සිදු කරන ලද ගනුදෙනු සම්බන්ධයෙන් කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් කළමනාකරණ දුර්වලතා අනාවරණය විය.

(අ) ළමා නිවාස පුනරුත්ථාපනය හා ඉදිකිරීම් සඳහා පළාත් පරිවාස කෙමසාරිස්වරුන් වෙත රු.9,866,395 ක් යවා තිබුණි. එම ඉදිකිරීම්වල ප්‍රගතිය, කාර්යසාධනය, පසුවිපරම් කටයුතු දෙපාර්තමෙන්තුව විසින් සිදුකර නොතිබූ අතර වැය කළ මුදලින් අපේක්ෂිත අරමුණු ඉටු කර තිබුණේද යන්න පිළිබඳ තහවුරු කර ගැනීමේ ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි.

(ආ) දරුවන් 1505 ක් දැනුවත් කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ප්‍රදේශීය හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත රු.1,574,162 ක් යවා තිබුණි. එම වැඩසටහන් ක්‍රියාත්මක කළ බවට අදාළ සැලසුම් සටහන්, පැමිණීමේ සටහන්, වැඩසටහන් න්‍යාය පත්‍ර හා දේශකවරු පිළිබඳ විස්තර ලබාගන නොතිබූ බැවින් පසුවිපරම් ක්‍රියාවලියක් තුළින් වැඩසටහන්වල සාර්ථකත්වය පිළිබඳ විමසා බැලිමක්ද සිදුකර නොතිබුණි.

(ඇ) පරිවාස නිලධාරින් පුහුණු කිරීම වෙනුවෙන් පළාත් සභා 8 කට රු.1,689,650 ක් යවා තිබුණි. එම වැඩසටහන් පැවැත්වූ බවට අදාළ විස්තර එනම් ඇස්තමේන්තු, පැමිණීමේ සටහන්, වාර්තා ලබාගෙන නොතිබූ අතර පුහුණුව තුළින් අපේක්ෂිත අරමුණු ඉටු කිරීම පිළිබඳ ප්‍රගතිය මැනීමට ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.

## 3.7 මතභේදයට තුඩුදෙන ගැටළු

සමාලෝචිත වර්ෂයේදී අත්දැකිම් හුවමාරු කර ගැනීමේ වැඩසටහන් 18ක් පැවැත්වීම සඳහා රු.669,906 ක් වැයකර තිබුණි. නිලධාරීන්ගේ අත්දැකිම් හුවමාරු කර ගැනීමේ වැඩසටහනක් ලෙස දක්වමින් හා ප්‍රතිපාදන සලසා නොතිබුණු සංස්කරණ සම්මේලනයක් පැවැත්වීමක් ලෙස හඳුන්වා දී ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරී/සහකාර නිලධාරී සුභසාධක සංගමයේ වාර්ෂික රැස්වීම පවත්වා තිබුණි. ඒ වෙනුවෙන් රු.806,227 ක් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව විසින් වැය කර තිබුණි.

## 3.8 මානව සම්පත් කළමනාකරණය

අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 6 | 3 | 3 |
| (ii) | තෘතියික මට්ටම | 240 | 234 | 6 |
| (iii) | ද්විතියික මට්ටම | 224 | 180 | 44 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 17 | 14 | 3 |
| | එකතුව | 487 | 431 | 56 |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂය අවසාන වන විට අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 56ක් පැවති තිබුණි. ඉන් ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 03 ක් පැවැතීම නිසා සැලැසුම් සකස් කිරිම හා අධීක්ෂණ කටයුතු නිසියාකාරව සිදු නොවීමත්, ද්විතියික මට්ටමේ තනතුරු 44 ක පුරප්පාඩු පැවැතීම නිසා සැලැසුම් ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩුද නිරීක්සණය විය.